අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

සියලු ම හිමිකම් ඇවිරිණි. All rights reserved. அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

ජ්‍යෙෂ්ඨ | බුද්ධි පරීක්ෂණය | කාලය - පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

විභාග අංකය -: ..................................

01) පරිමිතිය නියත වන විට වර්ගඵලය වැඩිම අගයක් දක්වන රූපය වන්නේ,

$i)$ ත්‍රිකෝණයේ $ii)$ සමචතුරස්‍රයේ $iii)$ වෘත්තයේ $iv)$ සෘජුකෝණාස්‍රයේ

02) සමචතුරස්‍ර සංඛ්‍යාවක් මෙන් ම ත්‍රිකෝණ සංඛ්‍යාවක් වන, සංඛ්‍යා දෙකක් වන්නේ,

$i)$ $1, 6$ $ii)$ $1, 36$ $iii)$ $10, 36$ $iv)$ $25, 36$

03) 2025 වර්ෂයේ මැයි මස 28 වන දින බදාදා දිනයකි. 2030 වර්ෂයේ මැයි මස 28 වන දිනය වන්නේ,

$i)$ ඉරිදා $ii)$ සඳුදා $iii)$ අඟහරුවාදා $iv)$ බදාදා

04) බහු අස්‍රකයත අභ්‍යන්තර කෝණ දෙකක් පරිපූරක වේ. ඉතිරි කෝණ සියල්ල සමාන වන අතර එකක් $144^0$ බැගින් වේ. බහු අස්‍රයේ නම වන්නේ,

$i)$ පංචාස්‍රය $ii)$ ෂඩස්‍රය $iii)$ සප්තාස්‍රය $iv)$ චතුරස්‍රය

05) නිඛිල සංඛ්‍යා දෙකක වර්ගවල ඓක්‍යය 50 ක් වේ. එම සංඛ්‍යා දෙකේ අන්තරය 6 කි. සංඛ්‍යා දෙකේ ගුණිතය වන්නේ,

$i)$ 54 $ii)$ 44 $iii)$ 3 $iv)$ 7

06) 1 සිට 199 තෙක් පූර්ණ සංඛ්‍යා සියල්ලේ එකතුව වන්නේ,

$i)$ 19900 $ii)$ 19000 $iii)$ 1900 $iv)$ 39800

07) $ABC$ ත්‍රිකෝණයේ පාදවල මධ්‍ය ලක්ෂ්‍ය යා කිරීමෙන් ලැබෙන ත්‍රිකෝණයේ පරිමිතිය $23cm$ කි. $ABC$ ත්‍රිකෝණයේ විශාල ම පාදයට තිබිය හැකි පූර්ණ සංඛ්‍යාත්මක වැඩි ම අගය වන්නේ,

$i)$ $12cm$ $ii)$ $11cm$ $iii)$ $23cm$ $iv)$ $22cm$

08) ඉලක්කම් තුනකින් යුත් පූර්ණ සංඛ්‍යාවක් 2 න්, 3 න්, 5 න් හා 6 න් බෙදූ විට 1 ක් ඉතිරි වේ. සංඛ්‍යාව සඳහා තිබිය හැකි කුඩා ම අගය වන්නේ,

$i)$ 31 $ii)$ 151 $iii)$ 101 $iv)$ 121

09) එක්තරා පිරිවෙණක 2023 වර්ෂය අවසානයේ සිටි ළමුන් සංඛ්‍යාවට අනුව, 2024 වර්ෂය අවසානයේ පැවිදි හා ගිහි ළමුන් සංඛ්‍යාවේ වෙනස් වීම වූයේ, පැවිදි ළමුන් 20%කින් වැඩි වූ අතර ගිහි ළමුන් 5%කින් අඩු විය. 2024 වර්ෂය අවසානයේ සිටි මුළු ළමුන් සංඛ්‍යාව 460 ක් නම් 2024 වර්ෂය ආරම්භයේ සිටි මුළු ළමුන් සංඛ්‍යාව වන්නේ,

$i)$ 400 $ii)$ 391 $iii)$ 445 $iv)$ 435

10) භාණ්ඩයක් රුපියල් 570 කට විකිණීමෙන් 14% ක ලාභයක් ලබා ගත හැකි විය. එහෙත් එහි මිල ලකුණු කර තිබුණේ 20% ක ලාභ ලැබෙන ලෙස නම් භාණ්ඩයේ ලකුණු කළ මිල වන්නේ,

$i)$ රුපියල් 600 $ii)$ රුපියල් 604 $iii)$ රුපියල් 500 $iv)$ රුපියල් 530

11) $13\frac{1}{3}\%$ භාගයක් ලෙස සරල ම ආකාරය වන්නේ,


$i)$ $\frac{1}{3}$ $ii)$ $\frac{2}{15}$ $iii)$ $\frac{4}{30}$ $iv)$ $\frac{40}{300}$

12) ත්‍රිකෝණය අභ්‍යන්තර කෝණ තුන අතර අනුපාතය $2:3:5$ වේ. මෙම ත්‍රිකෝණය,

$i)$ සුළුකෝණික ත්‍රිකෝණයකි. $ii)$ සෘජුකෝණික ත්‍රිකෝණයකි.

$iii)$ මහාකෝණික ත්‍රිකෝණයකි. $iv)$ ප්‍රකාශ කළ නොහැකිය.

13) රූපයේ දක්නට ලැබෙන සියලුම චතුරස්‍ර සෘජුකෝණාස්‍ර වේ නම් එහි දක්නට ලැබෙන මුළු සෘජුකෝණාස්‍ර සංඛ්‍යාව වන්නේ,



$i)$ 17 $ii)$ 18 $iii)$ 19 $iv)$ 20

අංක 09 හා 10 ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.

❖ ලීවලින් සාදන ලද දාරයක දිග $5cm$ වන ඝනකයක මුහුණත්වල සම්පූර්ණයෙන් නිල්පාට තීන්ත ආලේප කර ඇත. එම ඝනකය, දාරයක දිග $1cm$ වන කුඩා ඝනකවලට වෙන් කරන ලදි. එසේ වෙන් කළ ඝනකවල,

14) නිල් පාට තීන්ත ආලේපිත මුහුණත් දෙකක් පමණක් ඇති ඝනක සංඛ්‍යාව වන්නේ,

$i)$ 12 $ii)$ 20 $iii)$ 32 $iv)$ 36

15) නිල් පාට තීන්ත ආලේපිත මුහුණත් කිසිවක් නොමැති ඝනක සංඛ්‍යාව හා මුහුණත් තුනක් පමණක් නිල් පාට තීන්ත ආලේපිත ඝනක සංඛ්‍යාව අතර අනුපාතය වන්නේ,

$i)$ 9 : 8 $ii)$ 6 : 8 $iii)$ 8 : 27 $iv)$ 27 : 8

16) නිල් පාට තීන්ත ආලේපිත මුහුණත් එකක් පමණක් ඇති ඝනකවල මුළු පරිමාව වන්නේ,

$i)$ 63 $ii)$ 54 $iii)$ 36 $iv)$ 24

17) $\frac{1}{2}n(n+1)$ මගින් පොදු පදය අර්ථ දක්වන සංඛ්‍යා අනුක්‍රමයක 10 වන පදය වන්නේ,

$i)$ 100 $ii)$ 55 $iii)$ 45 $iv)$ 15

18) පහත දී ඇති ඒවායේ සමාන්තරාස්‍රයක් නොවන රූපය හෝ රූප වන්නේ,

a) ත්‍රපීසියම b) සමචතුරස්‍රය c) රොම්බසය d) සෘජුකෝණාස්‍රය

$i)$ $a$ පමණයි $ii)$ $c$ පමණයි $iii)$ $a, b$ පමණයි $iv)$ $a, b, c$ පමණයි

19) එක්තරා රහස් ඔත්තු සේවයකට ලැබුණු රහස් පණිවිඩයක් වන "$XBSEIUTX$" මගින් "$WITHDRAW$" යන්න අදහස් විය. වෙනත් දිනයක ලැබුණු පණිවිඩකින් "$CONCLEAED$" යන්න අදහස් විය. ඒ සඳහා රහත් ඔත්තු සේවයට ලැබුණු පණිවිඩයේ සටහන් වූයේ,

$i)$ $PDBMFDQOD$ $ii)$ $MDEBDFPOF$ $iii)$ $EFBFMDOPD$ $iv)$ $PRDMRPOQP$

20) තොරතුරු සමූහයක් දත්ත 100 කින් සමන්විත විය. එහි මධ්‍යන්‍යය සෙවීම සඳහා උපකල්පිත මධ්‍යන්‍යය **50** ලෙස ලබා ගත් අතර එම උපකල්පිත මධ්‍යන්‍යයට අනුව දත්තයන්ගේ අපගමනවල මධ්‍යන්‍යය **−340** ක් ලෙස ගණනය කර ගන්නා ලදි.

ඉහත දත්ත සමූහයේ මාත අගය සැබෑ මධ්‍යන්‍යයේ ආසන්න පූර්ණ සංඛ්‍යාවට වඩා **8** කින් වැඩි බව සොයා ගන්නා ලදි. ව්‍යාප්තියේ මාත අගය වන්නේ,

$i)$ 51 $ii)$ 48 $iii)$ 60 $iv)$ 55

21) සිරිසුමන ශිෂ්‍ය සාමනේර ස්වාමීන් වහන්සේ වාර පරීක්ෂණයක දී ගණිත හා ඉංග්‍රීසි විෂයන් සඳහා ලබා ගත් ලකුණු ආසන්න 10 ට වටැයීමෙන් ලබා ගත් ලකුණු වල එෙක්‍යය 140 ක් විය. ගණිත විෂය සඳහා ලබාගත් ලකුණු ප්‍රමාණය 78 ක් නම් ඉංග්‍රීසි විෂය සඳහා තිබිය හැකි ලකුණුවල උපරිම අගය විය හැකි වන්නේ,

$i)$ 66 $ii)$ 65 $iii)$ 64 $iv)$ 59

22) $P$ නගරයේ සිට $232km$ ක් දුරින් $Q$ නගරය පිහිටා ඇත. වෑන් රථයක් පෙරවරු 9: 00 ට $40kmh^{-1}$ ක එකාකාර වේගයෙන් $P$ නගරයෙන් පිටත් වූ අතර පෙරවරු 10: 00 ට කාර් රථයක් $50kmh^{-1}$ එකාකාර වේගයෙන් $P$ නගරයෙන් ගමන් කළේය. කාර් රථය, වෑන් රථය පසු කරන මොහොතේ රථ දෙක $Q$ නගරයේ සිට පිහිටා ඇති දුර වන්නේ,

$i)$ $10km$ $ii)$ $32km$ $iii)$ $40km$ $iv)$ $48km$

23) පරිධිය $30cm$ ක් වන වෘත්තයක චාපයක දිග $6cm$ කි. එම චාපය අයත් කේන්ද්‍රික ඛණ්ඩයේ කේන්ද්‍ර කෝණයේ අගය වන්නේ,

$i)$ $60^0$ $ii)$ $72^0$ $iii)$ $90^0$ $iv)$ $120^0$

24) මිනිසුන් 10 දෙනෙකුට දින 12 ක දී වැඩක් නිම කළ හැකිය. එය දින තුනකින් අවසන් කිරීමට අවශ්‍ය මිනිසුන් සංඛ්‍යාව වන්නේ,

$i)$ 4 $ii)$ 6 $iii)$ 36 $iv)$ 40

25) $\frac{34.432^2 - 9.432^2}{43.864}$ හි අගය වන්නේ,

$i)$ 2.454 $ii)$ 20 $iii)$ 25 $iv)$ 43.864

******